# සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්) - II වන ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීම

# මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

## නැගෙනහිර පළාත

නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාර යන දිස්ත්‍රික්කයන් සඳහා සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්) - II වන ශ්‍රේණියේ තනතුරු 03 ක් සඳහා සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සෑම අයදුම්කරුවෙකුම**

- නැගෙනහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට පැවරෙන රාජකාරී මනාව ඉටුකිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**අධ්‍යාපන සුදුසුකම් (පහත සුදුසුකම් 1 හෝ 2)**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කලා / වාණිජ / කළමනාකරණය / ගණිතය / විද්‍යා උපාධි සහතිකයක් ලබා තිබීම

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

ii. තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**වෙනත් සුදුසුකම්**

i. පිළිගත් රාජ්‍ය /පෞද්ගලික ආයතනයක පිරිස් කළමනාකරණය සම්බන්ධයෙන් වසර එකක (01) පළපුරුද්ද.

ii. තොරතුරු තාක්ෂණය සම්බන්ධව පිළිගත් ආයතනයකින් මාස 06 කට නොඅඩු සහතිකයක් ලබා තිබීම.

iii. සිංහල / දෙමළ /ඉංග්‍රීසි යන භාෂා හැසිරවීම පිළිබඳ මනා පළපුරුද්දක් තිබිය යුතුය.

**වයස :** අවුරුදු 22 නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් කේතය :** MM 1-2-2016

**වැටුප් පරිමාණය රුපියල් :** 54,550 - 1,375X10-1,910X15-96,950/= (කළ.සේ.චක්‍ර. අංක. 02/2016 ට අනුව)

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත නිලධාරියා පත් කරනු ඇත.

- පත්වීමේ ස්වභාවය - සියලුම පත්වීම් සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර මණ්ඩලයේ දායකත්වය ලැබෙන අතර, වසරක වැඩ බැලීමේ කාලයකට යටත් වනු ඇත. අවුරුදු තුනක පරිවාස කාලයකින් පසුව තනතුරේ ස්ථිර කරනු ඇත.
- මෙම සේවා ගණය සඳහා බඳවා ගන්නා සහ උසස් කිරීම් සියල්ලට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ කාර්ය පරිපාටියට අනුකූලවේ.
- නිලධාරීන් බඳවා ගැනීමෙන් අනතුරුව රැකියා කොන්දේසි හා අදාල කරුණු අධිකාරියේ කාර්ය පරිපාටි සංග්‍රහය අනුව සිදු කෙරේ.
- දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට ද ආයතන ප්‍රධානියා මගින් ඉල්ලුම් කළ හැකි අතර, තනතුර සඳහා තෝරාගතහොත් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා පරිපාටික රීති සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදය අනුව නිත්‍ය සේවයෙන් නිදහස් කරන බවට ආයතන ප්‍රධානී සහතික කොට තිබිය යුතුය.

**අයදුම් කරන පිළිවෙල :** අයදුම් කරන තනතුර සඳහා තැපැල් කාර්යාලය මගින් අධ්‍යක්ෂ ජනරාල්, නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යන නමට ලියූ රු. 200/- ක මුදල් ඇණවුමක් සහිතව සම්පූර්ණ ජීවදත්ත විස්තර ඇතුලත් අයදුම් පත්‍රයක් සමග උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත්‍රය, සියලුම අධ්‍යාපන සහතික හා පළපුරුද්ද දක්වෙන සියලුම සහතිකවල ඡායාස්ථිත පිටපත් **"සභාපති, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය, ඇතුලු වරාය පාර, ත්‍රිකුණාමලය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් 2017.05.30 දිනට පෙර එවිය යුතුය.

**සභාපති,**
**නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,**
**ඇතුලු වරාය පාර,**
**ත්‍රිකුණාමලය.**